සැ. යු.--2009.09.11 දින පළ කරන ලද අංක 1,619 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,620 - 2009 සැප්තැම්බර් මස 18 වැනි සිකුරාදා - 2009.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1370 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1373 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීත් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මීත් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 සැප්තැම්බර් මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 සැප්තැම්බර් මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

1367 - B 080049 —9,165 (2009/09)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරින් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරින්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරින්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරිහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරින්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරින්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්විමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරින් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරින් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරින් හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත හටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරිහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරින් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරින්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරින් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුට ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාව යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසංණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කැළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තිරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු – ඇබෑර්තු

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි), (දෙමළ/ඉංග්‍රීසි) හා (සිංහල/දෙමළ) තනතුරු

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි), (දෙමළ/ඉංග්‍රීසි) හා (සිංහල/දෙමළ) තනතුරු සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකිකයන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

02. *අධ්‍යාපන සුදුසුකම්/විකල්ප සුදුසුකම් :-*

**(සිංහල/ඉංග්‍රීසි) භාෂා පරිවර්තක තනතුරු සඳහා—**

(අ) i. සිංහල විෂයක් සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම; හෝ
ii. නීතිඥයකු වීම; හෝ
iii. බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයේ ත්‍රිපිටකවේ දී උපාධියක් ලබා තිබීම; හෝ
iv. ප්‍රාචීන අවසාන පරීක්ෂණය සමත්වීම.

(ආ) i. අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව හෝ ඉංග්‍රීසි සාහිත්‍යය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම, හෝ ජා. පො. අ. ස. විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා "බී" සාමාර්ථයක් ලබා තිබීම,හෝ
ii. අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**(දෙමළ/ඉංග්‍රීසි) භාෂා පරිවර්තක තනතුර සඳහා—**

(අ) i. දෙමළ විෂයක් සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම; හෝ
ii. නීතිඥයකු වීම; හෝ
iii. මදුරාසි විශ්වවිද්‍යාලයේ "පුලවර්" හෝ "විද්වාන්" සිව් අවුරුදු පාඨමාලා සමත්වීම.

(ආ) i. අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව හෝ ඉංග්‍රීසි සාහිත්‍යය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම, හෝ ජා. පො. අ. ස. විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා "බී" සාමාර්ථයයක් ලබා තිබීම හෝ,
ii. අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

(සිංහල/දෙමළ) භාෂා පරිවර්තක තනතුර සඳහා
අධ්‍යාපන සුදුසුකම්/විකල්ප සුදුසුකම් :
***සිංහල මාධ්‍ය අයැදුම්කරුවන් සඳහා—***

(අ) i. සිංහල විෂයක් සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම; හෝ
ii. නීතිඥයකු වීම; හෝ
iii. බුද්ධ ශ්‍රාවක ධර්ම පීඨයේ ත්‍රිපිටකවේදී උපාධියක් ලබා තිබීම; හෝ
iv. ප්‍රාචීන අවසාන පරීක්ෂණය සමත්වීම.

(ආ) i. අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව හෝ දෙමළ සාහිත්‍යය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම, හෝ ජා. පො. අ. ස. විභාගයේ දී දෙමළ භාෂාව සඳහා "බී" සාමාර්ථයක් ලබා තිබීම හෝ,
ii. අ. පො. ස (උ. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

*දෙමළ මාධ්‍ය අයැදුම්කරුවන් සඳහා -*

(අ) i. දෙමළ විෂයක් සහිතව පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම; හෝ
ii. නීතිඥයකු වීම; හෝ
iii. මදුරාසි විශ්වවිද්‍යාලයේ "පුලවර්" හෝ "විද්වාන්" සිව් අවුරුදු පාඨමාලා සමත්වීම.

(ආ) i. අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව හෝ සිංහල සාහිත්‍යය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ ජා. පො. අ. ස. විභාගයේ දී සිංහල භාෂාව සඳහා "බී" සාමාර්ථයක් ලබා තිබීම හෝ,
ii. අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව සඳහා යටත් පිරිසෙයින් සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

03. *වයස් සීමාව :*

2009.10.31 දිනට අවුරුදු 25ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ තනතුරු දරන අපේක්ෂකයන් කෙරෙහි මෙම උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.

04. *වැටුප් පරිමාණය :-*

MN/6-2006/A
මාසිකව රු. 17,680-10x320-11x365-15x450-රු. 30,685

05. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :*

අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය අනුව ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාවය මත බඳවා ගනු ලැබේ.

සිංහල/ඉංග්‍රීසි අපේක්ෂකයන් සඳහා විද්‍යාව, සාහිත්‍ය, නීති, ආර්ථික ගිණුම් ක්ෂේත්‍රවලට අදාළව සිංහලෙන් ඉංග්‍රීසියට හා ඉංග්‍රීසියෙන් සිංහලයට පරිවර්තනය කිරීම සඳහා ඡේද ඇතුළත් පැය 03ක ප්‍රශ්න පත්‍ර දෙකකි.

දෙමළ/ඉංග්‍රීසි අපේක්ෂකයින් සඳහා විද්‍යා, සාහිත්‍ය, නීති, ආර්ථික, ගිණුම් ක්ෂේත්‍රවලට අදාළව දෙමළෙන් ඉංග්‍රීසියට හා ඉංග්‍රීසියෙන් දෙමළට පරිවර්තනය කිරීම සඳහා ඡේද ඇතුළත් පැය 03ක ප්‍රශ්න පත්‍ර දෙකකි.

සිංහල/දෙමළ අපේක්ෂකයන් සඳහා විද්‍යාව, සාහිත්‍ය, නීති, ආර්ථික, ගිණුම් ක්ෂේත්‍රවලට අදාළව සිංහලෙන් දෙමළට හා දෙමළෙන් සිංහලයට පරිවර්තනය කිරීම සඳහා ඡේද ඇතුළත් පැය 03 ක ප්‍රශ්න පත්‍ර දෙකකි.

මෙම විභාගය රාජ්‍ය භාෂා කොමසාරිස්වරයා විසින් කොළඹ දී පවත්වනු ලැබේ.

ඔවුන්ගේ සුදුසුකම් හා සහතික යනාදිය පරීක්ෂා කිරීම සඳහා රාජ්‍ය භාෂා කොමසාරිස්වරයාගේ ප්‍රධානත්වයෙන් යුත් පරීක්ෂක මණ්ඩලයක් විසින් ඔවුන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

06. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

ii. තෝරාගනු ලබන අපේක්ෂකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව ද දැනටමත් රාජ්‍ය සේවයේ තනතුර ස්ථිර කර ඇති අයෙක් නම් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් ව ද පත් කරනු ලැබේ.

iii. සේවයේ ස්ථිර කරනු ලැබීමට පෙර සිංහල/ඉංග්‍රීසි අයැදුම්කරුවන් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් දෙමළ භාෂාව හා සාහිත්‍ය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

iv. සේවයේ ස්ථිර කරනු ලැබීමට පෙර දෙමළ/ඉංග්‍රීසි අයැදුම්කරුවන් අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සිංහල භාෂාව හා සාහිත්‍යය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

v. සේවයේ ස්ථිර කරනු ලැබීමට පෙර සිංහල/දෙමළ අයැදුම්කරුවන් අ. පො. ස (සා. පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව හෝ ඉංග්‍රීසි සාහිත්‍යය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

vi. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවයක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබා ගත යුතුය.

07. *සේවා කොන්දේසි :*

ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදාළ වේ.

08. මෙම නිවේදනයේ පහත දක්වා ඇති ආදර්ශ අයැදුම්පත්‍රය අනුව සම්පූර්ණ කර, අයැදුම්පත් 2009.10.31 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන්

රාජ්‍ය භාෂා කොමසාරිස්
"භාෂා මන්දිරය"
අංක 341/7, කෝට්ටේ පාර,
රාජගිරිය, යන ලිපිනයට එවිය යුතුය.

09. ඉල්ලුම්පත එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "භාෂා පරිවර්තක තනතුර (සිංහල/ඉංග්‍රීසි), (දෙමළ/ඉංග්‍රීසි) හෝ (සිංහල/දෙමළ) තනතුර සඳහා අයැදුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය.

10. ඉල්ලුම්පත්‍රය සෑම ආකාරයකින් ම සම්පූර්ණ කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන අයැදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, ඉල්ලුම්පත්‍රය හෝ ඒ හා සම්බන්ධ ලිපි තැපෑලේ දී නැති වූ බවට කරන පැමිණිලි සළකා බලනු නොලැබේ.

11. රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් සිය අයැදුම්පත් තමන්ගේ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය.

12. යම් අයැදුම්කරුවකුගේ අයැදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බව, ඔහු/ඇය තෝරා ගැනීමට පෙර දැන ගැනීමට ලැබුනේ නම් ඒ හේතුවෙන් ඔහු/ඇය නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමටත් ඉඩ ඇත.

ලේකම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ නියමය පරිදි ය.

රාජ්‍ය භාෂා කොමසාරිස්.

"භාෂා මන්දිරය",
අංක 341/7, කෝට්ටේ පාර,
රාජගිරිය.

*ආදර්ශ අයැදුම්පත්‍රය*

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි), (දෙමළ/ඉංග්‍රීසි) හා (සිංහල/දෙමළ) තනතුර සඳහා අයැදුම්පත්‍රය

අංකය :———.
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. සම්පූර්ණ නම සිංහලෙන් :———.
ඉංග්‍රීසියෙන් :———.
02. මුලකුරු සමග නම සිංහලෙන් :———.
ඉංග්‍රීසියෙන් :———.
03. පුද්ගලික ලිපිනය සිංහලෙන් :———.
ඉංග්‍රීසියෙන් :———.
04. කාර්යාලයීය ලිපිනය :———.
05. දුරකථන අංකය :———.
06. ජාතික හැඳුනුම්පත් අංකය :———.
07. උපන් දිනය :———.
08. 2009.10.31 වැනි දිනට වයස :
අවු. :———. මාස :———. දින :———.
09. ස්ත්‍රී/පුරුෂභාවය :———.
10. පුරවැසිභාවය :———.
11. ඉගෙනගත් භාෂා මාධ්‍යය :———.
12. අයැදුම් කරන්නේ භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි) තනතුරට ද නැතහොත් (දෙමළ/ඉංග්‍රීසි) තනතුරට ද නැතහොත් (සිංහල/දෙමළ) තනතුරට ද යන වග :———.
13. අධ්‍යාපන සුදුසුකම් :

**සමත් වී ඇති උසස්ම විභාගය**

| *ආයතනය* | *විභාගයේ නම* | *විෂය* | *වර්ෂය* |
|---|---|---|---|
| | | | |

**උපාධිය**

| *විශ්වවිද්‍යාලය* | *උපාධියේ නම* | *විෂය* | *වර්ෂය* |
|---|---|---|---|
| | | | |

අ. පො. ස. (උසස් පෙළ) විභාගය :

| පාසල | විෂය | සාමාර්ථය | වර්ෂය |
| --- | --- | --- | --- |
| | | | |

අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය :

| පාසල | විෂය | සාමාර්ථය | වර්ෂය |
| --- | --- | --- | --- |
| | | | |

වෘත්තීය සුදුසුකම් :

| ආයතනය | පාඨමාලාවේ ස්වභාවය | සිට | දක්වා |
| --- | --- | --- | --- |
| | | | |

ආධාරක වෙනත් අධ්‍යාපන සුදුසුකම් :———.

14. ඔබ නීතිඥයෙක් නම් වෘත්තියේ යෙදී සිටින කාලය :———.

පළපුරුද්ද :———.

15. ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටීමට බලාපොරොත්තු වන භාෂා දෙක :

(i) සිංහල සහ ඉංග්‍රීසි
(ii) දෙමළ සහ ඉංග්‍රීසි
(iii) සිංහල සහ දෙමළ

16. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සඳහන් කරන තොරතුරු සත්‍යවූත්, නිවැරදි වූත් ඒවා බැව් මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සකු වීමට යටත් වන බවත්, තෝරා පත් කිරීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දැන සිටිමි.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත අයෙක් නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

" ආ " **කොටස**

(ආයතන ප්‍රධානියාගේ නිර්දේශය)

මෙම අයැදුම්පත ඉදිරිපත් කරන ...................... මයා/ මිය/ මෙනෙවිය ............ දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ/ පළාත් සභාවේ ............ වශයෙන් සේවය කරන බවත්, ඉහත දක්වා ඇති විස්තර නිවැරදි බවත්, ඔහුගේ/ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බවත්, මම සහතික කරමි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/
බලයලත් නිලධාරියාගේ අත්සන.

නම :———.
තනතුර :———.
ලිපිනය :———.
දිනය :———.

09-571

---

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්මික ශිල්පී III ශ්‍රේණියේ තනතුරක් සඳහා බඳවා ගැනීම**

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්මික ශිල්පී III ශ්‍රේණිය තනතුර සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති දිස්ත්‍රික්කය තුළ පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුව පිළියෙල කරගත් අයදුම්පත් 2009.09.30 දිනට පෙර ලැබෙන සේ එවිය යුතු වේ. දැනටමත් සේවයේ නියුතු අය තම ආයතනයේ ප්‍රධානියා මගින් අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

1. *රැකියා විස්තරය.*—කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ගොඩනැගිල්ලේ විදුලිය හා ජලනල සම්බන්ධව නඩත්තු කටයුතු.

2. *වයස් සීමාව.*—අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ).

3. *අධ්‍යාපන සුදුසුකම්.*—අ. පො.ස. (සා/පෙළ) විෂයයන් 6කට නොඅඩු සම්මාන සාමාර්ථ දෙකක් සහිතව සමත්විය යුතුය.

4. *වෘත්තීය සුදුසුකම්.*—කාර්මික විද්‍යාලයකින් හෝ රජයේ පිළිගත් ආයතනයකින් විදුලි ශිල්පය හා ජලනල කාර්මික ශිල්පය ඇතුළත් මාස 03කට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබිය යුතුය.

5. *වාර්ෂික වැටුප් ක්‍රමය* : PL 3
රු. 12360 - 10 x 110 - 10 x 120 - 10 x 130 - 12 x 140 - රු. 17640 (6/2006 iv)

6. *සේවා කොන්දේසි .*— මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිතය. තෝරා පත් කරනු ලබන අයදුම්කරුවන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා බැඳී සිටියි.

7. *බඳවා ගැනීමේ ක්‍රමය.*— ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සෙකු තෝරාගනු ලැබේ.

8. *අයදුම්පත් ඉදිරිපත් කිරීම.*— අයදුම්කරුවන් තම අයදුම්පත් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස්කර 2009.09.30 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස "කාර්මික ශිල්පී III ශ්‍රේණියේ තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන හෝ අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර නොමැති හෝ

අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම හා අනෙකුත් කරුණු සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ. ඉල්ලුම්පත් ලද බව හෝ ප්‍රතික්ෂේප කළ බව දන්වා එවනු නොලැබේ.

එස්. හපුආරච්චි,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
කළුතර.
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

ආදර්ශ ඉල්ලුම්පත්‍රය

**කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්මික ශිල්පී III සේවයේ තනතුරට බඳවා ගැනීමේ අයදුම්පත**

01. (i) මුලකුරු සමඟ නම :————.
(ii) සම්පූර්ණ නම :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. (i) උපන්දිනය : අවුරුද්ද :———. මාසය :———. දිනය :———.
(ii) 2009.......... දිනට වයස අවු. :———. මාස :———. දින :———.

04. (i) සේවය කරන දෙපාර්තමේන්තුව/පළාත් සභාව :————.
(ii) තනතුර :————.

05. පදිංචි දිස්ත්‍රික්කය :————.

06. ලිපිනය (i) කාර්යාලීය :————.
(iii) පෞද්ගලික :————.

07. අධ්‍යාපන සුදුසුකම් :————.

08. වෘත්තීය සුදුසුකම් :————.

09. විවාහක/අවිවාහක බව :————.

................................................ වන මම මෙහි සඳහන් කරන ලද සියළුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා රජයේ සේවයෙන් පහකර, වැඩ තහනමකට ලක්කර, සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත් තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා හෝ නැති බවත් ප්‍රකාශ කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට කලින් හෙළි වුවහොත් මා නුසුදුස්සෙකු කිරීමට යටත් වන බවත් තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා තනතුරින් ඉවත් කිරීමට හැකි බවත් දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

**රජයේ සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

.................................. මහතාගේ අයදුම්පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ .................. තාවකාලික/අනියම් සේවකයෙකු ලෙස සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි බවත්/නොහැකි බවත් දන්වමි.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියා.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :————.

09-722

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2008 (2009)**

ඉහත සේවාවේ නිලධාරීන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් පිළිබඳ පරීක්ෂණය 2010 ජනවාරි මස ආරම්භ කොට පේරාදෙණියේ දී පැවැත්වීමට අපේක්ෂා කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. මේ සඳහා 2009 වසරේ ඔක්තෝබර් 15 දිනට ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ සිටි නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ දෙකටම එකවර ඉදිරිපත්වීමට හැකි පරිදි කාලසටහන් සකස් කරනු ලැබේ.

03. *විෂය නිර්දේශ* .— I වැනි II වැනි කාර්යක්ෂමතා කඩඉම් පාලනය කරන විෂය නිර්දේශ පත්‍ර හා අනෙකුත් විධිවිධාන සේවා ව්‍යවස්ථාවේ සඳහන් කර ඇත. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග I සඳහා වූ විෂය නිර්දේශ ඇමුණුම "අ" හිද කාර්යක්ෂමතා කඩඉම් II සඳහා වූ විෂය නිර්දේශය "ආ" හිද සඳහන් කර ඇත.

කාර්යක්ෂමතා කඩඉම් විභාගවල විෂයන් සඳහා පෙනී සිටීමේ දී එක් වරක දී හෝ වාර කිහිපයක දී පෙනී සිටිය හැක.

04. මෙම සේවාවේ නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉම් සඳහා පෙනී සිටිය යුතු විෂයයන් මෙසේය. :—

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය

| *I වන කාර්යක්ෂමතා කඩඉම* | | | *II වන කාර්යක්ෂමතා කඩඉම* | | |
|---|---|---|---|---|---|
| *විෂය අංකය* | *විෂයය* | *කාල සීමාව (පැය)* | *විෂය අංකය* | *විෂයය* | *කාල සීමාව (පැය)* |
| 01 | මූල්‍ය ක්‍රම | 03 | 01 | කොටස් 01 | 03 |
| 02 | පරිපාලනය | 03 | 02 | කොටස් 02 | 03 |
| 03 | දෙපාර්තමේන්තු රෙගුලාසි ප්‍රශ්න පත්‍රය I | 02 | 03 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය I | 03 |
| 04 | දෙපාර්තමේන්තු රෙගුලාසි ප්‍රශ්න පත්‍රය II | 03 | 04 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය II | 03 |
| 05 | විශේෂ ප්‍රශ්න පත්‍රය* | 03 | 05 | කොටස් 03- ප්‍රශ්න පත්‍රය III | 03 |
| | | | 06 | කොටස් 03- ප්‍රශ්න පත්‍රය IV | 03 |
| | | | 07 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය V | 03 |
| | | | 08 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය VI | 03 |
| | | | 09 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය VII | 03 |
| | | | 10 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය VIII | 03 |
| | | | 11 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය IX | 03 |
| | | | 12 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය X | 03 |
| | | | 13 | කොටස් 03 - ප්‍රශ්න පත්‍රය XI | 03 |

* *මේ සඳහා අයදුම් කළ යුත්තේ පශු පර්යේෂණ නිලධාරීන් පමණි.*

*සටහන.*—II කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ අයදුම්කරුවන් පෙනී සිටිය යුත්තේ කොටස් 01 හෝ කොටස් 02 යන ප්‍රශ්න පත්‍ර දෙකින් එකකට හා 03 හි සඳහන් ප්‍රශ්න පත්‍ර XI න් ප්‍රශ්න පත්‍ර දෙකකට පමණි. එක් ප්‍රශ්න පත්‍රයකට අවම වශයෙන් ලකුණු 40% ක් ලබා ගත යුතුය. ( I වැනි හා II වැනි කාර්යක්ෂමතා කඩඉම් විභාග දෙකෙන්ම සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% ක් හෝ ඊට වැඩියෙන් ලබාගත යුතුය.)

05. පහත උපුටා දක්වා ඇති 1966 සැප්තැම්බර් මස 04 වැනි දින හා අංක 701 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වැනි ඡේදය කෙරෙහි මෙම කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලට පෙනී සිටින නිලධාරීන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

දෙපාර්තමේන්තුගත විභාගවලට (උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ඇතුළුව) මාධ්‍ය විය යුත්තේ නිලධාරියා රජයේ සේවයට ඇතුල්වීමට පෙනී සිටි තරග විභාගයේ මාධ්‍ය හෝ රාජ්‍ය භාෂාවයි. තරග විභාගයක් නොමැතිව මුලින්ම සේවයට බැඳුණු අය සම්බන්ධයෙන් වූ විට උසස් කිරීමේ හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට මාධ්‍ය විය යුත්තේ නිලධාරියා සේවයට බැඳීමට සුදුසුකම්ලත් භාෂාව හෝ රාජ්‍ය භාෂාවයි.

06. පහත දැක්වෙන ප්‍රශ්නපත්‍ර වලට සිංහලෙන්, දෙමළෙන් හෝ ඉංග්‍රීසියෙන් උත්තර සැපයීමට අපේක්ෂකයින්ට හැකිවනු සඳහා විභාග කොමසාරිස් ජනරාල් විධිවිධාන සලස්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(i) මූල්‍ය ක්‍රම
(ii) පරිපාලනය
(iii) දෙපාර්මේන්තු රෙගුලාසි I
(iv) දෙපාර්තමේන්තු රෙගුලාසි II

07. අපේක්ෂකයන් තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගවලට පෙනී සිටින බැව් පසුව හෙළිවුවහොත්, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

08. ඉල්ලුම්පත්‍ර අමුණා ඇති ආකෘතියට අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කොට ඉදිරිපත් කළ යුතුය. එම කඩදාසියේ දෙපැත්තම පාවිච්චි කළ යුතුය. **ඉහත සඳහන් පරීක්ෂණ දෙකටම පෙනී සිටින්නේ නම් වෙන වෙනම එක් එක් විභාගයන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.** ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 08 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කල යුතුවේ. ඊට අදාල තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුවේ. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත් අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින් එම ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳ අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ. ඉල්ලුම්පත්‍ර පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

09. විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාග පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීතිරීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වූ නීතිරීති මෙම නිවේදනයේ අග පළකොට ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

10. ඉල්ලුම්පත්‍ර 2009.10.19 දිනට හෝ ඊට ප්‍රථම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට ලැබෙන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. විභාග ප්‍රවේශපත්‍ර නොලද අයදුම්කරුවන් ඔවුන් වෙත තබාගත් අයදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපතක් ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශපත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ලඟ තබාගෙන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත. නුදුරුව සිටින අයට පණිවිඩකරුවකු මගින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවට දැනුම්දීමට උපදෙස් දෙනු ලැබේ.

12. ඉහත 11 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවයන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින් විසින් පසුව ඉදිරිපත් කෙරෙන ලියකියවිලි සලකා බලනු නොලැබේ.

13. හැඳුනුම්පත් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති 1971 ජූනි මස 29 වැනි දින අංක එස්ඊ 274 දරන චක්‍රලේඛය කෙරෙහි සියළුම අපේක්ෂකයින්ගේ අවධානය යොමු කරනු ලැබේ. විභාග ශාලාවේ දී තමන්ගේ අනන්‍යතාව පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වනු ඇත. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවල දී අපේක්ෂකයාගේ අනන්‍යතාව, විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණකි.

14. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් ගෙන් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු අය කිරීමට තීරණය කර ඇත :

(අ) පළමු වතාවට සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.

| | රු. ශත |
|---|---|
| (ආ) ඉන්පසු එක් එක් වතාව සඳහා, | |
| සම්පූර්ණ විභාගය සඳහා | 100 0 |
| එක් විෂයකට | 50 0 |

අපේක්ෂකයින් විසින් අත්සන තබා නිසි පරිදි අවලංගු කිරීමෙන් ආදායම් මුද්දර මගින් ගාස්තු ගෙවිය යුතුය.

මෙම විභාගයට දැනටමත් පෙනී සිටි අපේක්ෂකයින්ට ඉහත දැක්වෙන පරිදි අදාල ගාස්තු ගෙවීමට නියම වේ.

සුනිමල් සේනාරත්න,
ලේකම්,
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.

2009 අගෝස්තු මස 24 වැනි දින,
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 45,
ශාන්ත මයිකල් පාර,
කොළඹ 03.

**ආදර්ශ අයදුම්පත**

***ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව***

***ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2008 (2009)***

Efficiency Bar Examination for Officers of the Sri Lanka
Animal Production and Health Service — 2008(2009)

(විභාගයේ නම ලිපිකවරයේ වමත් පස ඉහළ කෙළවරේ දැක්විය යුතුය.)
(කාර්යක්ෂමතා කඩඉම් විභාග 02ටම එකවර පෙනී සිටින්නේ නම් ඉල්ලුම්පත්‍ර 02ක් එවිය යුතුය.)

නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

නිලධාරියා ඉල්ලුම්කරන විභාගය :
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 1
දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2

01. (අ) මුල අකුරු අගට යොදා මුල් අකුරු සමඟ නම :———.
(උදා :-Nimalsiri K.A.)

(ආ) මුල් අකුරුවලින් හැඳින්වෙන නම් :———.

02. උපන් දිනය :- වර්ෂය [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

03. පදවි නාමය :———.
දෙපාර්තමේන්තුවේ නම :———.

04. ලිපිනය (ප්‍රවේශ පත්‍ර එවීම සඳහා):———.

05. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවාවට පත් කරන ලද දිනය :———.

06. නිවේදනයේ 04 වැනි ඡේදයේ දක්වා ඇති, විෂය අංක සහිතව පෙනී සිටීමට අපේක්ෂිත විෂයයන් (පැහැදිලිව සඳහන් කළ යුතුය.).

(i) විෂය අංකය : [ | ] විෂයය :———.
(ii) විෂය අංකය : [ | ] විෂයය :———.
(iii) විෂය අංකය : [ | ] විෂයය :———.
(iv) විෂය අංකය : [ | ] විෂයය :———.
(v) විෂය අංකය : [ | ] විෂයය :———.

07. මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට ඇත්දැයි සඳහන් කරන්න. එසේ නම් විෂයයන්ද වර්ෂය හා මාසයද සඳහන් කරන්න. :———.

08. ජාතික හැඳුනුම්පත් අංකය [ | | | | | | | | | ]

ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත්, ඉල්ලුම්පත්‍රයේ ඉහලින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. මෙම ඉල්ලුම්පත්‍රයට අලවන ලද මුද්දර මවිසින්ම අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද ඒවා බවද ප්‍රකාශ කරමි.

තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

09. ගෙවන ලද විභාග ගාස්තුව : රු. :

මුද්දර කොටුව

———,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :———.

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් මගින්
විභාග කොමසාරිස් ජනරාල්,

ඉදිරිපත් කරමි.

මෙම විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත්, මම සහතික කරමි.

* අපේක්ෂකයා/අපේක්ෂිකාව මුද්දර/මුද්දරය නිසි පරිදි අවලංගු කර ඇති බවද සහතික කරමි. අපේක්ෂකයාගේ අත්සන සහතික කරමි.

———————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
පදවි නාමය.

දිනය :———.

(*ගාස්තුව නොගෙවන විටදී කපා දැමිය යුතුය)

"අ" ඇමුණුම

(අ) ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වූ 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත වේ :—

1. මූල්‍ය ක්‍රම;
2. පරිපාලනය;
3. දෙපාර්තමේන්තු රෙගුලාසි - I
4. දෙපාර්තමේන්තු රෙගුලාසි - II

**1 මූල්‍ය ක්‍රමය**

මූල්‍ය ක්‍රම පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ :-

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය ( x වැනි පරිච්ඡේදය හැර)
(ආ) ගෙවී යන වර්ෂයේ ඇස්තමේන්තුගත (උදා : ඒවා සකස් කිරීම ශීර්ෂ මූල්‍ය ක්‍රම සහ විසර්ජන පනත්)
(ඇ) කච්චේරි මගින් විශේෂයෙන් කරගෙන යනු ලබන ගිණුම් පිළිබඳ ආඥාපනත්

* සටහන : සාමාර්ථය සඳහා මුළු ලකුණු වලින් 40% ක් අපේක්ෂකයෙකු විසින් ලබාගත යුතුය.

**2 පරිපාලනය**

පරිපාලනය පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ :-

(අ) කාර්යාල හා ක්ෂේත්‍ර සංවිධාන ක්‍රම
(ආ) ආයතන සංග්‍රහය : පරිච්ඡේද I, II, III, V, VI, VII, IX, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII

* සටහන.- සාමාර්ථය සඳහා මුළු ලකුණු වලින් 40% ක් අපේක්ෂකයෙකු විසින් ලබා ගත යුතුය.

**3 දෙපාර්තමේන්තු රෙගුලාසි - I**

දෙපාර්තමේන්තු රෙගුලාසි පිළිබඳ විභාගය පහත සඳහන් කරුණු මත පදනම් කරනු ලැබේ :—

මෙම ප්‍රශ්න පත්‍රය පහත විෂයයන් ගෙන් සමන්විත පැය 02 ක ප්‍රශ්න පත්‍රයකි. සත්ත්ව පනත යටතේ ඇති ස්පර්ශයෙන් බෝවන රෝග සඳහා වූ ආඥාපනත, සත්ත්ව පනත දෙපාර්තමේන්තු නියෝග හා පශු වෛද්‍ය සේවයට අදාළ චක්‍රලේඛ.

* සටහන.- සාමාර්ථය සඳහා මුළු ලකුණු වලින් 40% ක් අපේක්ෂකයෙකු විසින් ලබාගත යුතුය.

**4 දෙපාර්තමේන්තු රෙගුලාසි - II**

මෙම ප්‍රශ්න පත්‍රය පහත විෂයයන්ගෙන් සමන්විත පැය 03 ක ප්‍රශ්න පත්‍රයකි :—

(අ) නිදර්ශක බෙදාහැරීම පශ්චාත් මරණ පරීක්ෂණ ඇතුළු රසායනාගාර හඳුනාගැනීම්, ගැබ් පරීක්ෂාව ඇතුළු හඳුනාගැනීම් පරීක්ෂණ, බෝවන රෝග ස්පර්ශයෙන් බෝවන රෝග සඳහා එන්නත් හා මස්තු පරීක්ෂාව;

(ආ) කෘත්‍රිම සිංචන ක්‍රමවේදය හා එහි භාවිතය, වසුපැටවුන් බෝකිරීම හා ඇතිදැඩි කිරීමේ මූලධර්ම, බීජෞෂනය මගින් පැටවුන් ලබාගැනීමේ හා ඇතිදැඩිකිරීම, සත්ත්ව පෝෂණය පශු සම්පත් සඳහා ආහාර වේල හා එහි භාවිතය, පෝෂ්‍ය තෘණ වගාව, වියළි තෘණ සහ සයිලේජ් සැකසීම හා පශු සම්පත් කළමනාකරණය;

(ඇ) කිරි නිෂ්පාදනය, පැස්චරීකරණය කරන ලද කිරි බෝතල් කිරීම හා ප්‍රවාහනය, කිරිවල සෞඛ්‍ය ආරක්ෂිත බව, කිරිවල බැක්ටීරියා, මේදය කිරි විශ්ලේෂණය ඇතුළුව පරීක්ෂා කිරීම, යොදය වෙන් කිරීම, බටර් ගිතෙල් හා මී කිරි නිෂ්පාදනය;

(ඈ) ඝාතනාගාර සතුන් ඝාතනය කිරීම, මාංශ හඳුනාගැනීම් ඇතුළුව මාංශ පරීක්ෂා කිරීම.

* සටහන.- සාමාර්ථය සඳහා මුළු ලකුණු වලින් 40% ක් අපේක්ෂයෙකු විසින් ලබාගත යුතුය.

ඇමුණුම "ආ"

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන් සඳහා වූ II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පහත දැක්වෙන විෂයයන්ගෙන් සමන්විත වේ :—

1 කොටස : මෙම විෂය නිර්දේශයේ, 2 : 1, 2 : 2, 4:1, 4 : 2, 5 : 2, 5 : 8, 6 : 5, 7 : 2 : 1, 8 : 2, 8 : 2 : 2, 8 : 2 : 3, 8 : 3 : 1, 9 : 2, 9 : 4, 9 : 6, 9 : 7 කොටස් වලින් සමන්විත වේ. විෂය නිර්දේශය පේරාදෙණිය සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂ ජනරාල්ගෙන් හා සියළුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යක්ෂකවරුන්ගෙන් ලබාගත හැකිය.

2 කොටස : මෙම විෂය නිර්දේශයේ 1 : 1 : 1, 1 : 1 : 4, 1 : 2 : 1, 3 : 2, 3 : 1 : 1, 3 : 1 : 2, 3 : 2 : 1, 10 : 1 : 1, 10 : 1 : 2, 10 : 1 : 3, 10 : 1 : 4, 10 : 1 : 6, 10 : 2 : 1, 10 : 2 : 8 හා 10 : 4 : 1 කොටස් වලින් සමන්විත වේ. විෂය නිර්දේශය පේරාදෙණිය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් හා සියළුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යක්ෂකවරුන් ගෙන් ලබා ගත හැකිය.

| | | | |
|---|---|---|---|
| 3 කොටස : | 1 පත්‍රය | - | ව්‍යාධි විද්‍යාව |
| | 2 පත්‍රය | - | පශු සම්පත් ආර්ථික විද්‍යාව |
| | 3 පත්‍රය | - | පශු මහජන සෞඛ්‍ය |
| | 4 පත්‍රය | - | කෘෂි ව්‍යාප්තිය |
| | 5 පත්‍රය | - | ජාන විද්‍යාව හා අභිජනනය |
| | 6 පත්‍රය | - | සත්ත්ව කායික විද්‍යාව හා ප්‍රජනනය |
| | 7 පත්‍රය | - | සත්ත්ව නිවාසකරණය හා කළමනාකරණය |
| | 8 පත්‍රය | - | සත්ත්ව පෝෂණය |
| | 9 පත්‍රය | - | තෘණ හා ගෝචර තෘණ |
| | 10 පත්‍රය | - | ව්‍යවහාරික පශු ක්ෂුද්‍රජීව විද්‍යාව හා ප්‍රතිශක්තිකරණ විද්‍යාව |
| | 11 පත්‍රය | - | ව්‍යවහාරික, වෛද්‍ය විද්‍යාව, ව්‍යාධිවේදය හා පරපෝෂිතවේදය |

විස්තර පේරාදෙණිය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගෙන් හා සියළුම පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවල පළාත් අධ්‍යක්ෂකවරුන්ගෙන් ලබා ගත හැකිය.

09-472

---

**වෘත්තීය සහ කාර්මික පුහුණු අමාත්‍යාංශය**

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

"ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I පන්තියේ තනතුරු" මැයෙන් 2009.07.10 දිනැතිව පලකරන ලද ගැසට් නිවේදනයට අදාළව පහත සඳහන් ලකුණු ලබා දීමේ පරිපාටිය අනුගමනය කරනු ලබන බව සියලු අයදුම්කරුවන් වෙත මෙයින් දන්වමි.

තිලක් හපන්ගම,
ලේකම්.

2009 සැප්තැම්බර් මස 02 වැනි දින
වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය,
"නිපුණතා පියස",
අංක 354/2,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

**ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ I පන්තියේ තනතුරු සඳහා සම්මුඛ පරීක්‍ෂණයේ දී උපයෝගි කරගනු ලබන ලකුණු පරිපාටිය**

| (උපරිම - ලකුණු - 40) ජ්‍යෙෂ්ඨත්වය (2009.07.10 දින ගැසට් පත්‍රයේ 4 නිවේදනය) 2006.01.01 දක්වා එක් අවුරුද්දකට ලකුණු 05 බැගින් | | | කුසලතාවය (උපරිම ලකුණු 40) | (උපරිම - ලකුණු 10)<br>- පර්යේෂණ ග්‍රන්ථ හා ප්‍රකාශන ආදිය<br>- නව නිපැයුම්<br>- පැවරුම් ප්‍රකාශන<br>- පේටන්ට් බලපත්‍ර<br>- ප්‍රශංසා ලිපි | (උපරිම - ලකුණු 10) සම්මුඛ පරීක්‍ෂණ 10 භාෂාමය හා කරුණු පැහැදිලි කිරීමේ කුසලතාවය, නායකත්වය හා අනෙකුත් කුසලතා. (Skills Competitions /ජාත්‍යන්තර සහ දේශීය පුහුණු වැඩ සටහන්වලට සහභාගී වීම සහ ඉදිරිපත් කිරීම. |
|---|---|---|---|---|---|
| 4:3(1) | 4:3(11) | 4:3(111) | වෘත්තිය සුදුසුකම් - 10<br>(අමතර ලබාගත් සුදුසුකම් සඳහා)<br>පශ්චාත් උපාධි - 10<br>පශ්චාත් උපාධි ඩිප්ලෝමා - 07<br>උපාධි - 05<br>පුහුණු පාඨමාලාවලට සහභාගි වී ලබාගත් සහතික - 05 | පරිපාලන පළපුරුද්ද 30<br>I පන්තියේ උපලේඛනගත තනතුර<br>(රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කර ඇති) සේවා කාලය වසර 02කට වඩා වැඩිනම් (උපරිම ලකුණු ප්‍රමාණය ලබාදිය හැකිය)<br>II පන්තියේ උපලේඛනගත තනතුර (එක් වසරකට 03)<br>වෙනත් අධ්‍යයන කළමනාකරණ සහ පරිපාලන තනතුර (HOD) | |

09 761

---

**රජයේ භාෂා පරිවර්තක සේවයේ I වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2009**

1994.07.26 දිනැති අංක 829/7 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද භාෂා පරිවර්තක සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 08 වන ඡේදය යටතේ සළසා ඇති විධිවිධාන මත භාෂා පරිවර්තක සේවයේ I වන පන්තියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයක්, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2009 දෙසැම්බර් මස කොළඹ දී පවත්වනු ලබන අතර මෙම විභාගයට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යයවලින් ඉදිරිපත් විය හැකි ය. විභාගය සඳහා ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

02. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ පළ කර ඇත. නිවැරදිව හා පැහැදිළිව පිළියෙල කරනු ලබන අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 2009 ඔක්තෝම්බර් මස 19 වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල වෙත ලැබෙන ලෙස ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් විය යුතුය. අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

03 (i) අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 2.10 තෙක් ඡේද පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන අයදුම්පත්‍රය 8" x 12" ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් පිළියෙල කරගත යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කර ගත හැකි වුව ද, එය අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා සියලුම නිලධාරීන් විසින් තමන්ගේ අයදුම්පත් රාජ්‍ය භාෂාවෙන්ම පිළියෙළ කළ යුතු අතර ඒවා එම භාෂාවෙන් ම පිරවිය යුතුය. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න.

04. විෂය නිර්දේශය හා විභාග පරිපාටිය :

*පළමුවන විෂයය* : ප්‍රශ්න පත්‍ර අංක 01

(i) පොදු වැදගත්කමක් ඇති පාඨයකින්,
(ii) (අ) නිල ලේඛනයකින් හෝ වාර්තාවකින් හෝ උපුටාගත් කොටසක් : සහ

(ආ) පුවත්පත් ලිපියකින් හෝ වාර්තාවකින් උපුටාගත් කොටසක් : අයදුම්කරුවන් තම භාෂා පරිවර්තන මාධ්‍යයන් අනුව තෝරා ගත් පහත සඳහන් ආකාරවලින් එකක් අනුව පරිවර්තනය කිරීම.

(i) සිංහලෙන් දෙමළ බසට;
(ii) සිංහලෙන් ඉංග්‍රීසියට;
(iii) දෙමළ බසින් ඉංග්‍රීසියට.

ලකුණු 100 යි - පැය 3 ක ප්‍රශ්න පත්‍ර එකකි.

දෙවන විෂයය :- ප්‍රශ්න පත්‍ර අංක 02

(i) පොදු වැදගත් කමක් ඇති පාඨයකින්,
(ii) (අ) නිල ලේඛනයකින් හෝ වාර්තාවකින් හෝ උපුටාගත් කොටසක් : සහ
(ආ) පුවත් පත් ලිපියකින් හෝ වාර්තාවකින් උපුටාගත් කොටසක් : අයදුම්කරුවන් තම භාෂා පරිවර්තන මාධ්‍යයන් අනුව තෝරා ගත් පහත සඳහන් ආකාරවලින් එකක් අනුව පරිවර්තනය කිරීම.

(i) දෙමළ බසින් සිංහලට;
(ii) ඉංග්‍රීසියෙන් සිංහලට;
(iii) ඉංග්‍රීසියෙන් දෙමළ බසට.

ලකුණු 100 යි - පැය 03 ක ප්‍රශ්න පත්‍ර එකකි.

* සාමාර්ථ්‍යය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් ලකුණු සියයට හතළිහක් (40%) ක් හෝ ඊට වැඩියෙන් ලබාගත යුතුය.

05. අපේක්ෂකයන්ගේ අත්අකුරු පිළිබඳව සැළකිල්ලක් දක්වනු ලැබේ.

06. විභාග ගාස්තු :-

මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් වෙනුවෙන් පහත සඳහන් පදනම මත ගාස්තු අය කිරීමට තීරණය කර ඇත.

(අ) පළමු වන වතාව සඳහා ගාස්තු අය නොකෙරේ.

(ආ) ඉන්පසු එක් වතාවක් සම්පූර්ණ විභාගය සඳහා රුපියල් 175 කි. එක් විෂයයක් සඳහා රුපියල් 90 කි.

(ඉ) විභාග ගාස්තුව, විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 4000 -20 - 03- 20 -13 ට බැරවන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගත් මුදල් භාරගැනීමේ කුවිතාන්සියක් අයදුම්පතේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම සුදුසුය.

(ඊ) කුමන කරුණක් යටතේ වුව ද මෙම විභාග ගාස්තුව ආපසු ගෙවීමක් හෝ වෙනත් කිසිම විභාගයක් සඳහා මාරු කිරීමට හෝ ඉඩදෙනු නොලැබේ.

07. විභාගයට ඇතුළත් කර ගැනීම :-

(i) අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අපේක්ෂකයන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ. විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ ප්‍රවේශපත්‍ර අත්සන සහතික කරවා ගෙන ඉදිරිපත් කළ යුතුය. ප්‍රවේශපත්‍ර නොමැතිව ඔවුන්ට විභාග ශාලාවට ඇතුළු වීමට හෝ විභාගයට පෙනී සිටීමට හෝ අවසර නොදෙනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ හා අදාළ නම් මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතක් ද, දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

(ii) එක් එක් අපේක්ෂකයා වෙත ප්‍රවේශ පත්‍රය සමග කාල සටහනක් ද නිකුත් කරනු ලැබේ.

(iii) විභාග පැවැත්වීම පිළිබඳව විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවා ඇති නීතිරීති වලට අපේක්ෂකයන් බැඳී සිටිය යුතුය. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවෙනවා ඇත.

(iv) අපේක්ෂකයින් සඳහා පනවා ඇති නීති රීති මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ මුද්‍රණය කර ඇත.

*සටහන* : අයදුම්කරුවෙකු වෙත විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ලැබීම, මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා අයදුම්කරු සපුරාලිය යුතු සුදුසුකම් පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

08. විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කර ඇති විභාග අපේක්ෂකයන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු දිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

09. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාව*:—අපේක්ෂකයන්/අපේක්ෂිකාවන්, විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරෙන් කුමක් වුවත් භාරගනු ලැබේ.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

තම ප්‍රවේශ පත්‍රයට අමතරව ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

10. මෙම විභාග නිවේදනයේ විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

බී. පී. පී. එස්. අබේගුණරත්න,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2009 සැප්තැම්බර් මස 01 වැනි දින,
ඒකාබද්ධ සේවා අංශය,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

රජයේ භාෂා පරිවර්තක සේවයේ I වන පන්තියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 20009

Efficiency Bar Examination For Officers in Class I of the Government Translators' Service - 2009

(සැළකිය යුතුයි : මෙම ආකෘති පත්‍රය නිවැරදිව හා පැහැදිළිව අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත් අකුරින්ම පිරිවිය යුතුයි.)

1.0 ගැසට් නිවේදනයේ 04 වන ඡේදය අනුව ඔබ පරිවර්තනයෙහි යෙදෙන ආකාරය :

ප්‍රශ්න පත්‍ර අංක 01 : සිංහලෙන් දෙමළ බසට - 1
සිංහලෙන් ඉංග්‍රීසි බසට - 2
දෙමළ බසින් ඉංග්‍රීසියට - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ප්‍රශ්න පත්‍ර අංක 02 : දෙමළෙන් සිංහල බසට - 4
ඉංග්‍රීසියෙන් සිංහල බසට - 5
ඉංග්‍රීසියෙන් දෙමළ බසට - 6

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

* ප්‍රශ්න පත්‍ර අංක 01 ට හෝ ප්‍රශ්නපත්‍ර අංක 02 ට හෝ එම ප්‍රශ්න පත්‍ර දෙකටම හෝ පෙනී සිටිය හැකිය.

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————. උදාහරණ SILVA, A. B.

2.2 මුලකුරුවලින් හැඳින්වෙන නම් ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.

2.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.4 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ නම :————.

2.5 රාජකාරී ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

(ප්‍රවේශපත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

2.6 ස්ත්‍රී/පුරුෂ බව (ස්ත්‍රී -1/පුරුෂ - 0)

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.7 උපන් දිනය :-

වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

2.8 ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | |

2.9 දැනට දරන තනතුර :————.

2.10 පත්වීම් ලිපියේ අංකය :————.

3.0 3.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.

3.2 එසේ නොවේ නම්, විභාග ගාස්තු ගෙවා ලබාගත් (අමුණා ඇති) මුදල් භාරගැනීමේ කුවිතාන්සියේ අංකය :————.
දිනය :————.

නිකුත් කළ තැපැල් කාර්යාලය :————.

එක් විෂයයක් සඳහා රු. 90 ක් ද, සම්පූර්ණ විභාගය සඳහා රු. 175 ක් ද ගෙවා ඕනෑම තැපැල් කාර්යාලයකින් ලබා ගත් මුදල් භාරගැනීමේ කුවිතාන්සිය මෙහි ඇලවිය යුතුය. (කුවිතාන්සියේ ජායා පිටපතක් ළඟ තබාගන්න.)

4.0 අයදුම්කරුගේ සහතිකය :

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, මෙම අයදුම්පත්‍රය ආරම්භයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මා හට හිමිකම් ඇති බවත්, මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි. මෙම විභාගය සඳහා පනවා ඇති නීතිරීති පිළිපැදීමට ද එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

5.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

(i) මෙම අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින භාෂා පරිවර්තක සේවයේ I වන පන්තියේ භාෂා පරිවර්තකයකු බව ද,

(ii) ඉහත සපයා ඇති විස්තර නිවැරදි බව ද,

(iii) ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සෑම විටම සතුටුදායක බව ද, පසුගිය පස් අවුරුදු කාලසීමාව තුළ (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට භාජනය නොවූ බව ද,

(iv) ඔහු/ඇය මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද,

(v) නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් (අදාළ නොවේ නම් කපා හරින්න)
මම සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන සහ නිල මුද්‍රාව.

පදවි නාමය :————;
ලිපිනය :————;
දිනය :————.

09-719

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### ආයුර්වේද සිසු හෙද පුහුණුවට බඳවා ගැනීම - 2010

ආයුර්වේද සිසු හෙද පුහුණුව සඳහා බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අධ්‍යාපන සුදුසුකම් :

(අ) පැරණි විෂය නිර්දේශය යටතේ අ.පො.ස. (උ. පෙළ) විභාගයට එකවර පෙනී සිට විද්‍යා/ගණිත විෂය ධාරාවන්ගෙන් විෂයයන් 04 ම සමත්ව තිබීම හෝ නව විෂය නිර්දේශය යටතේ අ.පො.ස. (උ. පෙළ) විභාගය එකවර පෙනී සිට විද්‍යා/ගණිත විෂය ධාරාවන්ගෙන් විෂයයන් 03 ම සමත්ව තිබීම :

සහ

(ආ) අ. පො. ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ, ගණිතය හා විද්‍යාව යන විෂයයන් ද ඇතුළුව සම්මාන 04 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව තිබීම. අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉහත විභාග දෙකෙහි සහතිකවල සහතික කළ ඡායා පිටපත් අමුණා එවිය යුතුය.

02. අනෙකුත් සුදුසුකම් :

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය;

(ආ) 2010.01.01 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 35 ට නොවැඩි විය යුතුය;

(ඉ) උස අඩි 04 අඟල් 10 ට නොඅඩු විය යුතුය;

(ඊ) අවිවාහක විය යුතුය;

(උ) පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන්ගේ දූ දරුවන් අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ දී අදාළ අයදුම්කරුගේ මව/පියා පාරම්පරික වෛද්‍යවරයෙකු බවට සනාථ කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ සහතිකයක් හා ග්‍රාම නිලධාරීගේ සහතිකයක් ඉදිරිපත් කළ යුතු වේ.

03. අයදුම් කළ යුතු ක්‍රමය :

(අ) මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව 13" x 8" ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කළ යුතු වේ.

(ආ) අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර එය බහාලන කවරයේ වම් කෙළවරේ "ආයුර්වේද සිසු හෙද පුහුණුව සඳහා බඳවා ගැනීම-2010" යනුවෙන් සඳහන් කොට 2009.10.15 වැනි දින හෝ ඊට පෙර "ආයුර්වේද කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, නාවින්න මහරගම" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර තැපෑලේදී නැතිවීම හා ප්‍රමාද වීම පිළිබඳ වග කියනු නොලැබේ.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/අධ්‍යාපන සේවයේ/රජයේ ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු/රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වාර්ෂිකව රු.2,40,360 කට නොඅඩු ආරම්භක වැටුපක් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු හෝ එබඳු තනතුරක් දරන ලද රජයේ විශ්‍රාමිකයකු විසින් අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන සහතික කළ යුතුය.

04. තෝරා ගැනීමේ ක්‍රමය හා පුහුණු කිරීමේ පරිපාටිය :

(අ) අයදුම්කරුවන් අතරින් සුදුස්සන් තෝරා ගැනීම සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් විවෘත ලිඛිත තරග විභාගයක් පවත්වනු ලබන අතර ඉන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. තරග විභාගය සඳහා පහත සඳහන් විෂය නිර්දේශයට අනුව සකස් කළ පැය 01 ක ප්‍රශ්න පත්‍රයකට සියලුම අයදුම්කරුවන් පෙනී සිටිය යුතුය.

*විෂය නිර්දේශය :* බුද්ධි පරීක්ෂණය<br>සාමාන්‍ය දැනුම<br>විෂයානුබද්ධ දැනුම

(ආ) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අයදුම්කරුවන්ට සම්මුඛ පරීක්ෂණයේ දී ද ලකුණු ලබාදෙන අතර තරග විභාගයේ ලකුණු හා සම්මුඛ පරීක්ෂණයේ ලකුණු අනුව අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් ලකුණු ලබාදෙන පරිපාටිය පහත සඳහන් පරිදි වේ.

1. වෘත්තීය දැනුම හා පලපුරුද්ද;
2. පාරම්පරික වෛද්‍යවරයකුගේ දරුවන් සඳහා උපරිමය ලකුණු 30 ක්;
3. පෞරුෂත්වය.

තෝරාගත් අයදුම්කරුවන් ආයුර්වේද සිසු, හෙද/හෙදියන් වශයෙන් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සිංහල මාධ්‍යයෙන් පවත්වන අවුරුදු 03 ක පුහුණු වීමේ පාඨමාලාවක් හැදෑරිය යුතුය.

(ඇ) පුහුණුව සඳහා ඇතුළත් කර ගන්නා අවස්ථාවේ අභ්‍යාසලාභීන් වෙත ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි බල පැවැත්වෙන නීති රීති මාලාවක් සපයනු ලැබේ. මෙම නීතිරීති වලට හා කලින් කළ පනවනු ලබන වෙනත් නීතිරීතිවලට ද ඔවුන් යටත් වනු ඇත.

(ඈ) පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ පුහුණු කටයුතු හා හැසිරීම අසතුටුදායක වන හෝ විභාග හා නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වන අභ්‍යාසලාභීන් ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව නතර කිරීමට හැකිය.

පුහුණු කාලය තුළ දී අභ්‍යාසලාභීන් කිසිම ආකාරයක නිවාඩුවකට හිමිකම් නොලබන අතර පුහුණුව සඳහා නොපැමිණි දින වෙනුවෙන් දීමනාවෙන් සමානුපාතික මුදලක් අඩු කරනු ලැබේ. කෙසේ වෙතත් විභාගයට පෙනී සිටීම සඳහා සෑම වර්ෂයකම 80% ක පැමිණීම අනිවාර්ය වේ.

(ඉ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ පුහුණුව ලබන කාල පරිච්ඡේදය තුළ අභ්‍යාසලාභීන්ට පහත සඳහන් පරිදි දීමනා ගෙවනු ලැබේ :

1. පළමු අවුරුද්ද - මාසිකව රු. 12,920
2. දෙවන අවුරුද්ද - මාසිකව රු. 13,040
3. තෙවන අවුරුද්ද - මාසිකව රු. 13,160

(ඊ) පුහුණුව ලබන කාලය තුළ පුහුණුවෙන් ඉවත් වුවහොත් හෝ පුහුණුව හැර ගියහොත් පුහුණු කාලය තුළ ඔහුට හෝ ඇයට ගෙවනු ලබන දීමනා හා රජය විසින් පුහුණුව සඳහා දරන ලද වියදම් සඳහා වැය වූ මුදල ඔහු හෝ ඇය විසින් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වේ. මේ සඳහා සනාථ කළ හැකි වාර්ෂික ආදායම රු. 3,00,000 ක් හෝ ඊට වැඩි ආදායමක් ලබන ඇපකරුවන් දෙදෙනෙකු සමග අයදුම්කරු විසින් ගිවිසුමක් අත්සන් කළ යුතු වේ.

05. විවාහ නොවීමේ කොන්දේසි හා ගිවිසුම් :

(අ) සියළුම අයදුම්කරුවන් ඉල්ලුම් පත්‍රය එවන අවසන් දිනය වන විට අවිවාහකව සිටිය යුතු අතර, පුහුණුව ලබන තුන් අවුරුදු කාලය තුළ දී අවිවාහකව සිටීම අනිවාර්ය වේ. අවිවාහක බව සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ග්‍රාම නිලධාරී සහතිකයක් අයදුම්පත සමග අමුණා එවිය යුතු වේ.

(ආ) සිසු හෙද/හෙදියන් හෙද පුහුණු ඒකකයට ඇතුළත් වන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, එම පුහුණුව සම්පූර්ණ කිරීමෙන් පසුව සේවයෙන් විශ්‍රාම යන තෙක් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සේවය කරන බවටත් ආයුර්වේද කොමසාරිස් සමග ගිවිසුමකට ද එළඹිය යුතුය. ආයුර්වේද කොමසාරිස් විසින් මෙම කාල පරිච්ඡේදය කලින් කලට නිශ්චය කරනු ඇත.

06. සේවා නියුක්ත කරවීමේ නියමයන් :

(අ) ඉහත පරිදි පුහුණුවෙන් පසුව පැවැත්වෙන අවසන් විභාගයේ ප්‍රතිඵල මත III ශ්‍රේණියේ හෙද තනතුරට අදාළ වැටුප් පරිමාණය මත තනතුරුවල පුරප්පාඩු ඇති වන පරිදි ආයුර්වේද කොමසාරිස් විසින් පත්වීම් දෙනු ලැබේ.

(ආ) හෙද තනතුරට පත් කිරීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වන අතර එය විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වේ.

07. සේවා කොන්දේසි හා වැටුප් ක්‍රමය :

(අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි එම්ටී -7-2006 පරිදි රු. 15,080- 5 x 150 - 9 x 240 - 7 x 240 - 20 x 320 - 26,420 වැටුප් පරිමාණය මත හෙද නිලධාරී III ශ්‍රේණියේ තනතුරුවලට පවත්නා පුරප්පාඩු සඳහා පත් කරනු ලැබේ.

(ආ) හෙද සේවයේ සියලුම නිලධාරීන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, ආයුර්වේද හෙද ව්‍යවස්ථාවේ කොන්දේසිවලට ද, ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් නියම කරනු ලබන ප්‍රතිපත්තිවලට අනුව කරන ස්ථාන මාරු වීම්වලට, මුදල් හා වෙනත් රෙගුලාසිවලට ද, රජය විසින් වරින් වර පනවනු ලබන නීති රීති හා නියෝගයන්ට ද යටත් වනු ඇත.

ආර්. පී. ඩබ්ලිව්. ගුණවර්ධන,
ආයුර්වේද කොමසාරිස්,
ආයුර්වේද දෙපාර්තමේන්තුව.

ආදර්ශ අයදුම් පත්‍රය

**සිසු හෙද හෙදියන් පුහුණුව සඳහා බඳවා ගැනීම**

01. (අ) මුලකුරු සමග අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) :————.

02. තැපැල් ලිපිනය (ඉංග්‍රීසියෙන්) :————.

03. (i) ස්ථිර ලිපිනය (සිංහලෙන්) :————.
(ii) දිස්ත්‍රික්කය (ඉංග්‍රීසියෙන්) :————.

04. උපන් දිනය : වර්ෂය :——. මාසය :——. දිනය :——.

05. (i) ස්ත්‍රී/පුරුෂ භාවය (ii) විවාහක/අවිවාහක භාවය :

| | |
|---|---|
| පුරුෂ | |
| ස්ත්‍රී | |

| | |
|---|---|
| විවාහක | |
| අවිවාහක | |

අදාළ කොටුවේ (✓) යොදන්න.

06. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද යන වග :

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

අදාළ කොටුවේ (✓) යොදන්න

07. ජාතික හැඳුනුම්පත් අංකය :————.

08. උස : අඩි :————. අඟල් :————.

09. (අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය (විද්‍යා/ගණිත විෂය ධාරාව) :————.
(ලකුණු පිටපත් ද අමුණන්න)

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | ශ්‍රේණිය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | විෂයය | ශ්‍රේණිය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|
| 1. | | | 3. | | |
| 2. | | | 4. | | |

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය :

පළමු වාරය :

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.

(ii) විභාග අංකය :————.

| විෂයය | ශ්‍රේණිය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | විෂයය | ශ්‍රේණිය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|
| 1. | | | 7. | | |
| 2. | | | 8. | | |
| 3. | | | 9. | | |
| 4. | | | 10. | | |
| 5. | | | 11. | | |
| 6. | | | 12. | | |

දෙවන වාරය ඃ

(i) විභාගයේ වර්ෂය හා මාසය :————.

(ii) විභාග අංකය :————.

| විෂයය | ශ්‍රේණිය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා | විෂයය | ශ්‍රේණිය | කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා |
|---|---|---|---|---|---|
| 1. | | | 7. | | |
| 2. | | | 8. | | |
| 3. | | | 9. | | |
| 4. | | | 10. | | |
| 5. | | | 11. | | |
| 6. | | | 12. | | |

11. උසාවියක් ඉදිරියේ ඔබ කිසියම් චෝදනාවකට වැරදිකරු වී ඇත් ද ? ඔව් නම් විස්තර සපයන්න. :————.

| | |
|---|---|
| ඔව් | |
| නැත | |

12. අයදුම්කරුගේ සහතිකය ඃ

(අ) මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

(ආ) ම විසින් කරනු ලැබ ඇති මෙම ප්‍රකාශය අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දැන සිටිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ………………… මහතා/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය 2009 …… වැනි දින මා ඉදිරිපිට දී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන.

නිල මුද්‍රාව.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————;

තනතුර :————;

ලිපිනය :————.

09-679

---

## සංශෝධනය කිරීමයි

### අධ්‍යාපන අමාත්‍යාංශය

### ගුරු අධ්‍යාපනය පිළිබඳ පූර්ව සේවා වෘත්තීය පාඨමාලාවක් හැදෑරීම සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් කර ගැනීම - 2010

2009 සැප්තැම්බර් මස 11 වැනි සිකුරාදා දින අංක 1,619 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ I කොටසේ II(අ) ඡේදයෙහි විභාග, විභාග ප්‍රතිඵල ආදිය යන කොටස යටතේ ඉහත මාතෘකාවෙන් දැන්වීම් අංක 458 යටතේ පළ වූ නිවේදනයේ පිටු අංක 6හි 4.17 පාඨමාලා අංකය 17- සංගීතය (පෙරදිග) යටතේ වූ "4.17.1 2007 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී සංගීත විෂයය ඇතුළු විෂයයන් තුනකින් සමත් වීම"යන කොටස "4.17.1 2008 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී සංගීත විෂයය ඇතුළු විෂයයන් තුනකින් සමත් වීම" ලෙස නිවැරදි විය යුතු අතර, අයදුම් පත් භාර ගන්නා අවසන් දිනය "2009.09.25", "2009.10.02" ලෙස සංශෝධනය විය යුතුයි.

එම්. එම්. එන්. ඩී. බණ්ඩාර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2009 සැප්තැම්බර් මස 11 වැනි දින,
බත්තරමුල්ල,
ඉසුරුපාය,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

09-1142

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.